**තිරප්පනේ ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 ජනවාරි 01 දිනට පසු මිලදීගත් වත්කම් වර්ග 08 කට අදාළ ක්ෂය රු.20,792,412 ක් වුවත් එය රු.24,611,094 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ කඩ කුලී බිල්කිරීම රු.1,122,450 ක් වුවත් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ එය රු.1,185,344 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | LDSP ව්‍යාපෘතිය යටතේ සිදුකළ කොන්ත්‍රාත් වෙනුවෙන් වූ අතරුඳවුම් සඳහා ලැබුණු රු.760,875 ක් පොදු බැංකු ගිණුමේ තිබුණු නමුත් එය ලැබිය යුතු ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ උපලේඛනවල එකතු හා මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් 09 ක ශේෂයන් අතර, රු.6,093,682 ක වෙනසක් පැවතුණි. | පිළිගන්නා බව. | උපලේඛන අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | හිඟ කසළ බදු | 437,320 | (i) විස්තරාත්මක උප ලේඛන<br>(ii) කාල විශ්ලේෂණ | පිළිගන්නා බව. | තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | හිඟ කඩ කුලී | 8,980 | -එම- | -එම- | -එම- |
| (ඇ) | හිඟ මස් කඩ කුලී | 90,192 | -එම- | -එම- | -එම- |
| (ඈ) | පුස්තකාල තැන්පත් | 39,440 | -එම- | -එම- | -එම- |
| (ඉ) | විවිධ තැන්පත් | 2,115,609 | -එම- | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.2,871,785 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.5,198,874 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 770,000 | 909,130 | 507,815 | 612,324 | 908,200 | 830,738 | 796,362 | 211,009 |
| (ii) | කුලී | 7,247,000 | 5,400,744 | 4,239,992 | 1,819,757 | 6,283,000 | 3,592,075 | 3,023,262 | 659,005 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,829,250 | 3,134,136 | 1,234,136 | 8,597,026 | 3,508,000 | 1,533,050 | 3,200,708 | 6,697,026 |
| (iv) | වෙනත් ආදායම් | 8,262,645 | 5,593,443 | 3,037,758 | 5,320,107 | 7,202,990 | 3,647,962 | 4,933,918 | 2,764,422 |
| | | 20,108,895 | 15,037,453 | 9,019,701 | 16,349,214 | 17,902,190 | 9,603,825 | 11,954,250 | 10,331,462 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | 2023 දෙසැම්බර් 31 දින වනවිට හිඟ වරිපනම් රු.124,871 ක් හා හිඟ කසළ බදු රු.437,320 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු ඇති බව. | හිඟ මුදල් ද අයකරගත යුතුය. |
| (ආ) | **කුලී** | | |
| | සභාව සතු වත්කම් කුලියට ලබාදීම වෙනුවෙන් ලැබිය යුතු හිඟ කඩ කාමර කුලී රු.518,586 ක් ද, යන්ත්‍ර කුලියට ලබාදීම වෙනුවෙන් ලැබිය යුතු හිඟ කුලී රු.757,150 ක් ද, හිඟ නිවාස කුලී රු.8,980 ක් ද සහ හිඟ මස් කඩ කුලී රු.90,190 ක් ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් ද අයකරගත යුතුය. |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටලයකින් අයවිය යුතු රු.8,597,026 ක බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා සභාව අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි. | මෙම මුදල් අයකර ගැනීම සඳහා නඩුවක් පවරා ඇති බව. | නඩුව සඳහා අවශ්‍ය විස්තර ඉදිරිපත් කර අයකර ගැනීමට ක්‍රියාකළ යුතුය. |
| (ඈ) | **වෙනත් ආදායම්** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.892,504 ක් හා මුද්දර ගාස්තු රු.4,011,100 ක් අයකරගෙන නොතිබුණි. | තහවුරු කළ පසු මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | සභාවට ලැබිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් එම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අදහස් දක්වා නොමැති බව. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 ජනවාරි 19 දින කැබ්රථයට සිදුවී තිබූ අනතුර හේතුවෙන් රු.32,500 ක වියදමක් ද, 2019 මාර්තු 30 දින කැබ්රථයට සිදුවී තිබූ අනතුර හේතුවෙන් රු.4,800 ක වියදමක් ද, අලුත්වැඩියා කිරීම සඳහා වැයවී තිබූ නමුත් ඒ පිළිබඳව මුදල් රෙගුලාසි (104) සහ 105 ප්‍රකාරව මූලික හා අවසන් පරීක්ෂණ පවත්වා එයට වගකිවයුතු පාර්ශව හඳුනාගෙන එම මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොමැති බැවින් අයකර ගැනීමට නොහැකි වී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සභාවට අයත් ලබුනෝරුව පුස්තකාලය වසා දමා තිබුණු අතර සභාවේ සේවකයෙකු යොදවා එම පුස්තකාලය විවෘත කර පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | විවෘත කිරීමට කටයුතු කරන බව. | විවෘත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |
| (ආ) | බල ප්‍රදේශයේ විථි ලාම්පු සවිකිරීම් එම අලුත්වැඩියා කටයුතු හා ඒ සම්බන්ධ මහජන පැමිණිලි පිළිබඳව කටයුතු කිරීම සම්පූර්ණයෙන් නවතා දමා තිබුණි. | මේ සඳහා සේවකයෙකු බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබාගැනීමට ඉල්ලුම් කර ඇති බව. | විථි ලාම්පු සවිකිරීම හා සම්බන්ධ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) | සභාවට අයත් මුරියාකඩවල තිබෙන කඩ කාමර 04 ක් සඳහා 2023 වර්ෂය වෙනුවෙන් බිල්කිරීම් සිදුකර තිබුණු නමුත් එම කඩ කාමර සම්බන්ධව අවශ්‍ය පරීක්ෂා කිරීම සිදුකර ගිවිසුම් යථාවත් කිරීම සඳහා කටයුතු සිදුකර නොතිබුණි. | ගිවිසුම්ගත වීමට කටයුතු කරන බව. | ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2019 ඔක්තෝබර් සිට 2022 දෙසැම්බර් දක්වා කාලය වෙනුවෙන් සේවා නියුක්ති භාරකාර අරමුදලට ගෙවිය යුතු දායක මුදල් ප්‍රමාද කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු.99,077 ක අධිභාරය ගෙවීමට කටයුතු කර නොතිබුණි. | අධිභාරය ගෙවීමට කටයුතු කරන බව. | අධිභාරය ගෙවීමට කටයුතු කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු නාච්චාදූවේ පිහිටි කඩ කාමර 10 ක් පිළිබඳ සභාවේ නිලධාරීන් ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබීම නිසා එම බදුකරුවන් තම අභිමතය පරිදි ඉදිකිරීම් වෙනස් කිරීම සිදුකර තිබුණු අතර ගිවිසුම් යාවත්කාලීන කර නියමිත තක්සේරු කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් යාවත්කාලීන කර හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කරන බව. | ගිවිසුම් යාවත්කාලීන කර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේදී රු.1,431,543 ක් වියදම් කර ඇතුන්ගම ඉදිකළ කඩ කාමරය හා රු.1,472,920 ක් වියදම් කර දයාගම ඉදිකළ කඩ කාමරවල වහලය නොමැතිවීම නිසා නිෂ්කාර්යව පැවතුණි. | මෙම කඩ කාමර අලුත්වැඩියා කිරීමට ප්‍රමාණවත් මුදල් නොමැති බව. | මෙම කඩ කාමරවල අත්‍යවශ්‍ය අලුත්වැඩියාවන් සිදුකර ගිවිසුම්ගත වී ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

# 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1. වාෂර්ික ක්‍රියාකාරී සැලස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික අයවැය අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලස්මක් පිළියෙල කර තිබුණු නමුත් ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ ඉටුකළ යුතු කාර්යයන් පිළිබඳව එම සැලසුමේ සඳහන් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැති බව. | ක්‍රියාකාරී සැලස්ම නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.2 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් කසළ කළමනාකරණ මධ්‍යස්ථානය හා නාච්චාදූව සොහොනාගාරය වෙනුවෙන් මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර බලපත්‍ර ලබාගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | මෙම ස්ථානවල පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීමෙන් පසු පරිසර බලපත්‍රය ලබාගැනීමට කටයුතු කරන බව. | පරිසර බලපත්‍ර ලබාගැනීමට අවශ්‍ය නිර්දේශිත අඩුපාඩු නිවැරදි කර පරිසර බලපත්‍ර ලබාගැනීමට කටයුතු කළ යුතුය. |